*සැ. යු.* - 2015.04.24 වැනි දින පළ වූ අංක 1,912 දරන *ගැසට් පත්‍රයේ* II කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,913 - 2015 අප්‍රේල් මස 30 වැනි බ්‍රහස්පතින්දා - 2015.04.30**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | 618 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 618 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | 619 |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 621 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 622 |


*සැ. යු.* - දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත සහ විසිතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත 2015 මාර්තු මස 27 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II කොටසේ අතිරේකයන් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 මැයි මස 22 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 මැයි මස 08 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*.

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

617 - B 80943 - 5,302 (2015/04)
2 B 4 –

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**මහාධිකරණය - නුවරඑළිය**

නුවරඑළිය මහාධිකරණ කලාපීය ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් මෙහි පහත උපලේඛනයේ දැක්වෙන නුවරඑළිය මහෙස්ත්‍රාත් අධිකරණය මගින් රාජසන්තක කරන ලද මෝටර් වාහන ටෙන්ඩර් මගින් විකිණීම සඳහා 2015 මැයි මස 22 වැනි දින දක්වා ටෙන්ඩර් අයදුම්පත් භාරගනු ලැබේ.

02. එක් එක් අයිතමය සඳහා වෙන වෙනම ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුතු අතර, ඒ සඳහා ආපසු නොගෙවන රු. 100 ක ටෙන්ඩර් ගාස්තුවක් ගෙවා නියමිත ආකෘති පත් හා විස්තර නුවරඑළිය මහාධිකරණයෙන් ලබාගත යුතු ය ටෙන්ඩර් අයදුම්පත් නිකුත් කරනු ලබන්නේ 2015 මැයි මස 20 වැනි දින දක්වා පමණි.

03. ආපසු ගෙවනු ලබන ටෙන්ඩර් තැන්පතුවක් ද අධිකරණයේ තැන්පත් කළ යුතු අතර අදාළ මුදල උපලේඛනයේ දක්වා ඇත. ටෙන්ඩර් පත්‍රයේ පිටපත් දෙක සමග මුදල් ගෙවන ලද කුවිතාන්සි ඡායා පිටපතක් ද, අමුණා එවිය යුතු අතර, ටෙන්ඩර්පත් ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ "වාහන සඳහා මිල ගණන් වාහන අංකය ..................." යනුවෙන් සඳහන් කර නුවරඑළිය මහාධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

04. වාහන පරීක්ෂා කිරීම 2015 මැයි මස 20 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවලදී නුවරඑළිය මහෙස්ත්‍රාත් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරියගේ පූර්ව අනුමැතිය ඇතිව කාර්යාල වේලාව තුළ දී පරීක්ෂා කළ හැකි ය.

05. ටෙන්ඩර්පත් විවෘත කරන අවස්ථාවේ දී ටෙන්ඩර්කරුවන්ට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට සහභාගි විය හැකි අතර, 2015 මැයි මස 27 වැනි දින ප. ව. 1.30 නුවරඑළිය මහාධිකරණයේ දී කලාපීය ප්‍රසම්පාදන කමිටුව මගින් ටෙන්ඩර්පත් විවෘත කරනු ලැබේ.

06. ලියාපදිංචි තැපෑලෙන් දැනුම් දීම ලැබී දින 03ක් ඇතුළත සම්පූර්ණ වටිනාකම ගෙවා වාහන ඉවත් කර ගත යුතු ය.

07. ටෙන්ඩර් භාර ගැනීම විවෘත කිරීම, ප්‍රතික්ෂේප කිරීම අවලංගු කිරීම පිළිබඳ බලතල ටෙන්ඩර් මණ්ඩලය සතු වන අතර මේ සම්බන්ධ වැඩිදුර විස්තර අවශ්‍ය වන්නේ නම් දුරකථන අංක 052 - 2222293 ඔස්සේ නුවරඑළිය මහෙස්ත්‍රාත් අධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙතින් ලබාගත හැකි ය.

*උපලේඛනය*

| *නඩු අංකය* | *වාහන ලියාපදිංචි අංකය* | *වර්ගය/මාදිලිය* | *ඇප තැන්පතුව රුපියල්* | *වාහන පරීක්ෂා ස්ථානය* |
|---|---|---|---|---|
| 27279 | CPYE 6495 | ත්‍රීවිල් රථය | 2,000 0 | නුවරඑළිය මහෙස්ත්‍රාත් අධිකරණය |
| 5682/10 | CPYC 2178 | ත්‍රීවිල් රථය | 2,000 0 | නුවරඑළිය මහෙස්ත්‍රාත් අධිකරණය |
| 18501 | CPQZ 8637 | ත්‍රීවිල් රථය | 2,000 0 | නුවරඑළිය මහෙස්ත්‍රාත් අධිකරණය |

ඊ. ඩබ්. එම්. ලලිත් ඒකනායක,
මහාධිකරණය,
නුවරඑළිය.

2015 අප්‍රේල් මස 09 වැනි දින,
නුවරඑළිය මහාධිකරණයේ දී ය.

04-878

---

# බඩු බාහිරාදිය විකිණීම්

**බකමූණ සංචාරක මහෙස්ත්‍රාත් අධිකරණය**

අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද රාජසන්තක කරනු ලැබූ සහ මෙතෙක් හිමිකම් නොකියන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

01. බකමූණ සංචාරක මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාලව රාජසන්තක කරනු ලැබූ සහ මෙතෙක් හිමිකම් නොකියන ලද සහ කල්තබා ගැනීමේ දී විනාශ වී යා හැකි භාණ්ඩ 2015.05.02 වැනි දින පෙ. ව. 10.00 එම අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි සඳහන් වන කිසියම් භාණ්ඩයක් සම්බන්ධයෙන් හිමිකම් පාන්නකු වේ නම් වෙන්දේසිය පවත්වන දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කලයුතු අතර, ඒ පිළිබඳ සලකා බැලීම සඳහා අදාල භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කරනු ලැබේ.

03. අධිකරණයේ රෙජිස්ට්‍රාර් වරයාගේ අවසරය ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පැය එකහමාරකට පෙර වෙන්දේසියේ නියමිත භාණ්ඩ මහජනයාට පරීක්ෂා කර බැලිය හැකි ය.

04. අධිකරණය විසින් නියම කරනු ලබන ලංසුව නොපිලිගැනෙන අවස්ථාවලදී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් මිලදී ගනු ලබන භාණ්ඩ භාරගැනීමේ දී හා මුදල් ගෙවීමේ දී තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු අතර භාණ්ඩ මිලදී ගැනීමට එන සෑම අයෙකුටම ජාතික හැඳුනුම්පත රැගෙන ඒම අනිවාර්යය වේ.

06. භාණ්ඩ මිලදී ගැනීම මුදලින් කළ යුතු අතර මිලදී ගන්නා ලද භාණ්ඩ වෙන්දේසිය පවත්වන දිනයේ දී ප. ව. 4.00 ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

එන්. එච්. හාල්පන්දෙනිය හේවගේ,
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය,
හිඟුරක්ගොඩ.

2015 අප්‍රේල් මස 09 වැනි දින,
හිඟුරක්ගොඩ දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**නඩු භාණ්ඩ ලැයිස්තුව**

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ වර්ගය |
|---|---|---|
| 01. | 34186 | කැට කුඩ 01යි |
| 02. | 34152 | උදලු 01යි |
| 03. | 32965 | කැටකුඩ 01යි, ඉල්ලන්කුර 01යි |
| 04. | 32966 | කැට කුඩ 01යි |
| 05. | 32967 | ගැරුම් වට්ටි 01යි |
| 06. | 32968 | ඉල්ලන්කුරු 01යි. කැට කුඩ 01යි |
| 07. | 32959 | ඉල්ලන්කුරු 01යි, කැට කුඩ 01යි |
| 08. | 32964 | කැට කුඩ 01යි |
| 09. | 32962 | ඉල්ලන්කුරු 01යි, කැට කුඩ 01යි |
| 10. | 32963 | උදලු 01යි, කැට කුඩ 01යි |
| 11. | 31769 | කැට කුඩ 01යි |
| 12. | 31617 | ගැරුම් වට්ටි 01යි |
| 13. | 34079 | කැට කුඩ 01යි, උදලු 01යි |
| 14. | 32961 | උදළු 01යි, කැට කුඩ 01යි |
| 15. | 30980 | වතුර මෝටර් 02යි, මල්ටි ෆ්ලග් එක සහිත අඩි 18ක් දිග වයරය, අඩි 81ක් දිග වයරය, අඩි 30ක් දිග නිල්පාට කැන්නස් වතුර බටය, අඩි 47ක් දිග ලණු 01යි, අඩි 118ක් දිග සුදු පැහැති වයරය, අඩි 13 බැගින් දිග එස්ලෝන් බට 02යි, අඩි 28ක් දිග ඇල්කතින් බටය, ඉල්ලන් කුරු 02යි, උදලු 01යි, උල්කටු 02යි |
| 16. | 33277 | වතුර මෝටරය, අඟල් 02 අඩි 10 අඟල් 02 දිග රබර් හෝස් 01යි, උදළු 01යි, ඉල්ලන් කුරු 01යි, යකඩ බාල්දි 01යි, කුඩ 01යි |
| 17. | 31140 | කැට කුඩ 01යි |
| 18. | 31768 | කුඩ 01යි |
| 19. | 31499 | උදලු 01යි, ගැරුම් වටට් 02යි. කැට කුඩ 01යි, අලවංගු 01යි |
| 20. | 31902 | ගැරුම් වට්ටි 01යි |
| 21. | 32960 | උදලු 01යි, කුඩ 02යි |
| 22. | 32703 | උදලු 01යි, කුඩ 01යි, නොකියා වර්ගයේ ජංගම දුරකථන 01යි |
| 23. | 30452 | උදලු 01යි |
| 24. | 30729 | සවල් 01යි, කුඩ 01යි |
| 25. | 30969 | උදලු 01යි, යකඩ ඉනි 01යි |
| 26. | 33572 | ගැරුම් වට්ටි 01යි |
| 27. | 33278 | ගැරුම් වට්ටි 01යි |
| 28. | 33574 | ගැරුම් වට්ටි 01යි |
| 29. | 33573 | ගැරුම් වට්ටි 01යි |
| 30. | 33068 | කුඩ 01යි |
| 31. | 33081 | වේවැල් කුඩ 01යි |
| | | WP KD 1860 දරන කාර් රථයෙන් ඉවත් කරන ලද ඉදිරිපස ප්‍රධාන ලාම්පු 02, මඩ්ගාඩ් 02, බ්‍රෂර්ස් 02, යකඩ කුරු 02යි |
| 33. | | හිස් බෝතල් තොගයක් |

04-879

---

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

**කල්පිටිය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය**

2015 ජූලි මස සිට 2016 ජුනි මස දක්වා රා තැබෑරුම් රේන්ද විකිණීම

2015 ජූලි මස 01 වැනි දින සිට 2016 ජුනි මස 30 වැනි දින දක්වා මාස 12 ක කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළ වී ඇති රා රේන්ද විකිණීමේ කොන්දේසි හා සෑම සුරාබදු බලපත්‍රයකටම අදාළව එවකට පවත්නා කොන්දේසි මාලාවට යටත්ව පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක් ම, ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක සකස් විය යුතු අතර, පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති ටෙන්ඩර් තැන්පත් මුදල, තැන්පත් කළ බවට ලබාගත් කුවිතාන්සියක් හා අදාළ ටෙන්ඩරයේ සඳහන් මිල ප්‍රමාණයෙන් යටත් පිරිසෙන් 15% කට ලබාගත් වටිනාකම් සහතිකයක් ඇමිණිය යුතු ය.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ සෑම ටෙන්ඩරයක්ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙළවරෙහි "අංක ................................ දරන ................................ රා තැබෑරුම සඳහා" යනුවෙන් හා පහත සඳහන් උපලේඛනයේ සඳහන් පරිදි තැබෑරුමේ නම සහ අංකය සඳහන් කොට 2015.05.18 වැනි දින පෙ. ව. 10.30 ට පෙර කල්පිටිය ප්‍රාදේශීය ලේකම්ට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. නැතහොත් එම වේලාවට පෙර කල්පිටිය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතු ය.

04. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම 1982.08.20 වැනි දින පළ වී ඇති අංක 207 දරන ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට් පත්‍රයේ* දැක්වෙන රා රේන්ද කොන්දේසිවලට අනුකූල විය යුතු ය.

05. 2015.05.18 වැනි දින පෙ. ව. 10.30 ට ටෙන්ඩර් පත්‍ර භාරගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ දී සියලුම ටෙන්ඩර්කරුවන් කල්පිටිය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

06. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් නැවත විකිණීම 2015.06.04 වැනි දින පෙ. ව. 10.30 ට සිදු කරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම ද මෙම *ගැසට් නිවේදනයේ* සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතු ය.

07. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර කල්පිටිය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක.

කේ. පී. රංගන ප්‍රනාන්දු (වැ. බ.),
ප්‍රාදේශීය ලේකම්,
කල්පිටිය.

2014 අප්‍රේල් මස 16 වැනි දින,
කල්පිටිය,
කල්පිටිය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *අනු. අංකය* | *කොට්ඨාසය* | *ග්‍රාමය* | *තැබෑරුම* | *ටෙන්ඩර් පත්‍රය භාරගන්නා අන්තිම දිනය හා වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු. ශත* |
|---|---|---|---|---|---|
| 01. | කල්පිටිය | දළුව | රා | 2015.05.18 වැනි දින පෙ. ව. 10.30 | 1,000 |
| 02. | කල්පිටිය | ඒත්තාල | රා | 2015.05.18 වැනි දින පෙ. ව. 10.30 | 1,000 |

04-893

---

**මඩකලපුව දිස්ත්‍රික්කය - ඒරාවූර් පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

රා තැබෑරුම් රේන්ද විකිණීම - 2015/2016 වර්ෂය

**2015 ජූලි මස 01 සිට 2016 ජුනි මස 30 දක්වා - ආරුමුගත්තාන් කුඩියිරුප්පු රා තැබෑරුම් රේන්ද විකිණීම**

අංක 207 දරන 1982.08.20 දින ප්‍රකාශ කරන ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පළ කරන ලද 1982 වර්ෂයේ රා තැබෑරුම් රේන්ද විකිණීමේ විධිවිධානයේ මඩකලපුව දිස්ත්‍රික්කයේ ඒරාවූර් පත්තුව, වෙංකලඩි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ආරුමුගත්තාන් කුඩියිරුප්පු රා තැබෑරුම් සඳහා 2015 ජූලි මස 01 වැනි දින සිට 2016 ජුනි මස 30 වැනි දින දක්වා රා විකිණීමේ පෞද්ගලික අයිතියට ටෙන්ඩර් ඉල්ලුම්පත් පහත සඳහන් දින හා වේලාව දක්වා ඒරාවූර් පත්තුව, වෙංකලඩි ප්‍රාදේශීය ලේකම් විසින් එම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී භාර ගනු ලැබේ. ටෙන්ඩර්පත් විවෘත කරන අවස්ථාවේ ටෙන්ඩර්කරුවන් ඒරාවූර් පත්තුව, වෙංකලඩි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පැමිණිය යුතු ය.

01. ටෙන්ඩර් ඉල්ලුම්පත්‍රය වෙනුවෙන් රු. 1,500 ක මුදලක් ඒරාවූර් පත්තුව, වෙංකලඩි ප්‍රාදේශීය ලේකම් නමින් එම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ගෙවා ලබා ගන්නා ලද රිසිට්පත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඉල්ලුම්පත ලබා ගත හැකි ය. ටෙන්ඩර්පත් සමග රිසිට්පත අමුණා තිබිය යුතු ය. ටෙන්ඩර්පත් නිකුත් කරනු ලබන්නේ 2015 මැයි 12 දින සිට 2015 මැයි මස 22 වැනි දින ප. ව. 3.00 දක්වා පමණි.

02. ඒ ඒ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන වටිනාකම් සහතික ටෙන්ඩර්කරුවන් බදු පත්‍රයේ සඳහන් කරනු ලබන මුදලින් 15% කට නොඅඩු නොවිය යුතු ය. මෙම වටිනාකම් සහතිකය ටෙන්ඩර්පත්‍රය සමග ඇමිණිය යුතු ය.

03. ටෙන්ඩර්පත් වැරදි ලෙස පුරවා තිබේ නම් එය ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. ටෙන්ඩර්පත්‍ර ඉදිරිපත් නොකර ටෙන්ඩර්පත්‍ර සඳහා ගෙවන ලද මුදල නැවත ලබා ගැනීමට අවශ්‍ය නම් ඔබගේ ඉල්ලීම ටෙන්ඩර්පත්‍ර ඉදිරිපත් කරන ලද දින සිට සති දෙක ඇතුළත ඔබ විසින් ලබාගත් ටෙන්ඩර්පත සම්පූර්ණ නොකර මුදල් ගෙවූ රිසිට්පත් සමග නැවත ඉදිරිපත් කරන්නේනම් එම ඉල්ලීම සලකා බලනු ලැබේ.

05. දැනට තිබෙන තැබෑරුම් ඉඩම් ඉදිරි කාලවලටත් තිබේදැයි සහතික නැත.

06. ලියාපදිංචි කරන ලද පොල් සහ තල් සංගම් මෙම ටෙන්ඩ විකිණීමේ දී සහභාගි වන්නේ නම් සංගම පිහිටා තිබෙන ප්‍රදේශයට රා තැබෑරුමට පමණක් ඉල්ලුම්පත් ඉදිරිපත් කළ හැකි ය. ඒ සමග සංගම දැනට ක්‍රියාත්මක වන බවටත් සංගමය විසින් රා තැබෑරුම් බදු ගෙන පවත්වා ගෙන යාමට හැකියාව තිබීම සම්බන්ධව මඩකලපුව දිස්ත්‍රික් සමුපකාර සහකාර කොමසාරිස් විසින් සහතික කරන ලද ලිපිය ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ටෙන්ඩර්පත් නිකුත් කරනු ලැබේ. (මුදල් අමාත්‍යාංශයේ අංක 01/2012 දරන හා 2012.01.05 වැනි දිනැති චක්‍රලේඛයට අනුව).

07. අතිකුත් තොරතුරු ඒරාවූර් පත්තුව, වෙංකලඩි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගත හැකි ය.

යූ. උදයශ්‍රීදර්,
ප්‍රාදේශීය ලේකම්.

2015 අප්‍රේල් මස 10 වැනි දින,
ඒරාවූර් පත්තුව,
වෙංකලඩි.

**රා තැබෑරුම පිහිටුවිය යුතු ස්ථානය**

| *තැබෑරුම පිහිටුවිය යුතු ස්ථානය* | *තැබෑරුමේ අංකය* | *ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනය හා වේලාව* | |
|---|---|---|---|
| | | *දිනය* | *වේලාව* |
| ආරුමුගත්තාන් කුඩියිරුප්පු | TT No. 1 | 2015.05.29 | පෙ. ව. 10.00 |

***සටහන*** .- 1. ටෙන්ඩර් කමිටුව 2015.05.29 වැනි දින පෙ. ව. 10.00 ට රැස්වේ.
2. විකුණුම් දිනයේ සුදුසු බදුකරු තෝරා නොගත්තොත් නැවත විකිණීමේ 2015.06.12 වැනි දින ප. ව. 2.00 ට පැවැත්වේ.

04-884

---

# රජයේ නොවන දැන්වීම්

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

පුත්තලම රත්මල්යාය කොළඹ පාර අංක 504 හි පදිංචි වාප්පු මොහොමඩ් එහියාන් වන මා විසින් කොළඹ 10, ජුම්මා මස්ජිඩ් පාර අංක 415/95, දරන ස්ථානයේ පදිංචි මොහොමඩ් එහියාන් යසාර් අස්මත් යන අය වෙනුවෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් වන එම්. එස්. නිලාමුදීන් මහතා විසින් 2013.08.21 වැනි දින හා අංක 1708 යටතේ ලියා සහතික කරන ලද හා කොළඹ සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයේ ඇටෝර්නි බලපත්‍ර ලේඛනයේ 08 වන කාණ්ඩය 13 වන පත් ඉරුවේ දිනපොත් අංක 2616 යටතේ 2013.08.30 වැනි දින දී ලියාපදිංචි කර ඇති ඇටෝර්නි බලපත්‍රය, බල රහිත කොට අවලංගු කරන බව මින් ප්‍රකාශ කරන අතර, මින් පසුව ඔහු විසින් සිදුකරනු ලබන කිසිම ක්‍රියාවකට, බලයකට ඔප්පුවකට හෝ කරුණකට ඔහු වෙනුවෙන් මා වග නොකියන බව ද ප්‍රකාශ කර සිටිමි.

වාප්පු මොහොමඩ් එහියාන්.

04-873

## ඇටෝර්නි බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

දික්ඔය කාසල්රි වීදියේ, 252/6 හි පදිංචි සුබ්‍රමනි ඒන්ජල්භාට් මසිලාමනි වන මම මාගේ ඇටෝර්නි බලකරු වශයෙන් හැටන් නිකලස් මාවතේ, අංක 3 හි හාවස්ට් විෂන් මිනිස්ට්‍රීස්හි අධ්‍යක්ෂ ගරු එමිලි එම්. අතිසායරාජ් වෙත ප්‍රදානය කරන ලද නුවරඑළිය ප්‍රසිද්ධ නොතාරිස් එස්. එම්. ආර්. රාමරාජා විසින් සහතික කරන ලද අංක 1973 හා 2010 මාර්තු 12 වැනි දින දරන ඇටෝර්නි බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ඨකර අවලංගු කරන ලද බව ශ්‍රී ලංකා රජය සහ පොදු මහජනතාව වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

04-871

**2007 අංක 07 දරන සමාගම් පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම**

සමාගමේ නම : කැන්ලො ට්‍රේඩිං (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 91840
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 212/49 බී, බෝධිරාජ මාවත, කොළඹ 11
සංස්ථාගත කළ දිනය : 2013.04.02
අධ්‍යක්ෂ : ඒ. එච්. එන්. හුසේන්.

04-880

---

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**ලංකා බැංකුව**

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 22 වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

ණය යොමු අංකය : 73570041
සිරිකොඩිය ටේස්ට් ෆුඩ් සෙන්ටර් සමාගමට අයත් උකස් කරන ලද දේපළ විකිණීම.

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2015.03.06 දිනැති අංක 1905 දරන ගැසට් පත්‍රයේ හා 2015 පෙබරවාරි මස 18 වැනි බදාදා දින " ඩේලිනිව්ස්", "දිනමිණ", හා "තිනකරන්" යන පුවත්පත් වල පළ කරන ලද ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මුතියකට අනුකූලව මුල් ණය මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ අංක 26 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍ර එකී ස්ථානයේ දී ම 2015.05.23 වැනි දින පෙ. ව. 11.00 ට කොළොන්නාව, විහාර මාවතේ, අංක 50/3 හි පදිංචි ටී ඇන්ඩ් එච් ඔක්ෂන්ස් හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහත විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කඩුවෙල ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයේ, කඩුවෙල මහනගර සභා සීමාව තුළ හේවාගම් කෝරළේ, පල්ලෙපත්තුවේ අංක 479/බී දරන ආසිරි උයන පැලවත්ත ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ දකුණු තලංගම ග්‍රාමයේ ආසිරි උයන 1 වන පටුමගේ අංක 59 දරන වරිපනම් අංකය දරන මැසුන් එස්ටේට් හි කොටසක් (එහෙත් මිල්ලගහවත්ත මැසුන් එස්ටේට් ලෙස ලියාපදිංචි කර ඇති) ඉඩමෙහි බලයලත් මිනින්දෝරු අයි. ඒ. සී. සේනාරත්න විසින් සාදන ලද 1990 මැයි 05 දිනැති අංක 2972 දරන පිඹුරෙහි ලොට් 6 ඒ ලෙස දක්වා සීමා නිර්ණ කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 6 ඒ උතුරට අංක 1786 දරන පිඹුරෙහි ලොට් 7 ද, නැගෙනහිරටඃ ඊ. ඕ. ඩී. ෆොන්සේකාගේ ඉඩම ද, දකුණට : ලොට් 6 බී ද, බස්නාහිරට : අංක 1786 දරන පිඹුරෙහි ලොට් ඒ ද මායිම්ව එකී අංක 2972 දරන පිඹුරට අනුව පර්චස් දහයක (අ. 0, රූ. 0, පර්. 10) බිම් ප්‍රමාණයකින් සමන්විත වන අතර එහි ඇති ගහකොළ, වැවිලි සහ සියලු දේ සමග වේ. මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 206/30 හි ලියාපදිංචි කර ඇත.

එකී තලංගම ග්‍රාමයේ පිහිටි මැසුන් එස්ටේට් හි කොටස නමැති ඉඩමෙහි බලයලත් මිනින්දෝරු බී. ජේ. තිඩිමන් විසින් සාදන ලද 1953 මැයි 30 දිනැති අංක 8539 දරන පිඹුරෙහි ලොට් 20 (පාරට වෙන් කළ කොටස) ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 20 උතුරට : අංක 8539 දරන පිඹුරෙහි ලොට් 35 ද, නැගෙනහිරට : අංක 8539 දරන පිඹුරෙහි ලොට් 13, 12, 11 සහ 10 ද දකුණට : බොරැල්ල, සිට පන්නිපිටිය දක්වා ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ (PWD) පාර ද, බස්නාහිරට : අංක 8539 දරන පිඹුරෙහි ලොට් 14 සහ 15 ද, මායිම්ව එකී අංක 8539 දරන පිඹුරට අනුව පර්චස් දාහතයි දශම හයයි බිංදුවක (අ. 0, රූ. 0, පර්. 17.60) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී 521/266 හි ලියාපදිංචි කර ඇත.

එකී තලංගම ග්‍රාමයේ පිහිටි මැසුන් එස්ටේට් නමැති ඉඩමෙහි බලයලත් මිනින්දෝරු වී. ඒ. එල්. සේනාරත්න විසින් සාදන ලද 1960 ජුනි 01 දිනැති අංක 1786 දරන පිඹුරෙහි ලොට් ඒ (පාරට වෙන්කළ කොටස) ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් ඒ උතුරට : ලොට් 23 සහ 10 ද, නැගෙනහිරට : ලොට් 4-9 සහ ඊ. ඕ ද ෆොන්සේකා උරුමකම් කියන ඉඩම ද, දකුණට : ලොට් 20, 13, 35 සහ 5ඒ ද, බස්නාහිරට : ලොට් 19 එකී අංක 85392 දරන පිඹුරට අනුව රූඩ් එකයි පර්චස් විසිඑකයි දශම නවයයි තුනක (අ. 0, රූ. 1, පර්. 21.93) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී594/271 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එස්. එස්. විජේකෝන් මිය,
කළමනාකාරිණී.

ලංකා බැංකුව,
මාලඹේ.

04-875

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 22 වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

ණය යොමු අංකය : 72982566

පී. එස්. පැටර්න් ගාමන්ට්ස් (පුද්ගලික) සමාගමට අයත් උකස් කරන ලද දේපළ විකිණීම

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2015.03.06 දිනැති අංක 1905 දරන ගැසට් පත්‍ර හා 2105 පෙබරවාරි මස 18 වැනි බදාදා දින "ඩේලිනිව්ස්", "දිනමිණ", හා "තිනකරන්" යන පුවත්පත්වල පළ කරන ලද ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මුතියකට අනුකූලව මුල් ණය මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලිය ද, ලංකා බැංකු ආඥාපනතේ අංක 26 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍ර එකී ස්ථානයේ දී ම 2015.05.16 වැනි දින පෙ. ව. 11.00 ට කොලොන්නාව, විහාර මාවතේ, අංක 50/3 හි පදිංචි ටී ඇන්ඩ් එච් ඔක්ෂන්ස් හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලෙ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ පොදු අරාව ග්‍රාමසේවා නිලධාරී කොට්ඨාසයේ කඩුවෙල මහ නගර සභා සීමාව තුළ උතුරු තලංගම පිහිටි "කොස්ගහවත්ත" නමැති ඉඩමට එහි ඇති ගහකොළ, ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ ඇතුළත්ව බලයලත් මිනින්දෝරු එම්. එල්. එන්. පෙරේරා විසින් සාදන ලද 2008 නොවැම්බර් මස 24 දිනැති අංක 4949 දරන පිඹුරෙහි ලොට් ඒ ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් ඒ උතුරට : අංක 944 දරන පිඹුරෙහි නිරූපිත ලොට් සී සහ මීටර් 4.5 පළල පාර ද, නැගෙනහිරට : අංක 944 දරන පිඹුරෙහි ලොට් සී (මීටර් 4.5 පළල පාර) සහ අංක 3412 දරන පිඹුරෙහි ලොට් ඒ 1 ද, දකුණට : අංක 3412 දරන පිඹුරෙහි ලොට් ඒ 1 සහ පිඹුරු අංක 4791 හි ලොට් 4 ද, බස්නාහිරට : අංක 4791 දරන පිඹුරෙහි ලොට් 4 සහ මීටර් 4.5 පළල පාර ද, මායිම්ව අංක 4949 දරන පිඹුරට අනුව පර්චස් විසිහයක (අ. 0, රූ. 0, පර්. 26) බිම ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 02/88 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එස්. එස්. විජේකෝන් මිය,
කළමනාකාරිණී.

ලංකා බැංකුව,
මාලඹේ.

04-876

## නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී එල් සී

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය ප්‍රකාරව වෙන්දේසිය පිළිබඳ දැන්වීම

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ දකුණු ගගබොඩ පත්තුවේ කරන්දෙණිය ප්‍රාදේශීය සභා සීමාව තුළ, වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ, අංක 193 බී මද්දේවෙල ග්‍රාම නිලධාරී වසමේ, දිවිතුරේ පිහිටි කොස්ගහබැද්ද නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම් පී ආර් ආනන්ද විසින් මැන සාදන ලද අංක 803 සහ 2006 මැයි මස 15 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද කැබැලි අංක ඒ දරන බිම් කොටස.

ප්‍රමාණය : (අ. 0, රූඩ් 2, පර්. 30) රූඩ් දෙකයි පර්චස් තිහක් විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගොඩනැගිලි ගහකොළ පළතුරු ආදී සෑම සියලු දේ සමග වේ. මෙම දේපළ ඇල්පිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පී 10/102 දරන වෙළුමේ/පත්‍රිරුවේ ලියාපදිංචි කර ඇත.

තවද, බලයලත් මිනින්දෝරු ඩබ්ලිව් ඒ ගර්වින් විසින් මැන සාදන ලද අංක 2697 සහ 1983 ජුනි මස 6 සහ 8 දෙදින මැන සාදන ලද පිඹුරේ නිරූපිත කැබැලි අංක 3 මතින් ගමන් කිරීමේ මාර්ග අයිතිය ද සමග

ප්‍රසිද්ධ නොතාරිස් රෝමනී තලවත්ත විසින් සහතික කරන ලද අංක 285 සහ 2013 අප්‍රේල් මස 24 වැනි දින දරන උකස් බැඳුම්කරය මගින් මෙහි ඉහත උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම් දේපළ සහ පරිශ්‍රය මුණුගොඩ හේවගේ දර්ශණ එන් චන්ද්‍රසිරි උකස්කරු වශයෙන්, කොළඹ 02, යූනියන් පෙදෙසේ, අංක 242 හි පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. නමට උකස් කොට ඇපයට තබා ඇති උකස් බැඳුම්කරය මගින් සුරක්ෂිත කරන ලද එකී පහසුකම් මත ලැබිය යුතු ගෙවීම මුණුගොඩ හේවගේ දර්ශණ එන් චන්ද්‍රසිරි ණයගැණුම්කරු වශයෙන් පැහැර ඇති හෙයින්, නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී එල්. සී විසින් අප හට පවරා ඇති බලය ප්‍රකාරව 2015ක් වූ මැයි මස 22 වැනි දින පෙ. ව. 10.30 ට අදාළ දේපළ පිහිටි ස්ථානයේ දී අප විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.* - අම්බලන්ගොඩ ඇල්පිටිය මාර්ගයේ කුරුඳුගහහැතැප්ම බසාර් දෙසට ගමන් කොට දකුණට ඇති බටපොළ පාරට හැරෙන්න. (ගාල්ල - ඇල්පිටිය පාර) දක්ෂින අධිවේගි මාර්ගයට නුදුරින් පෙර කී බසාර් එකට මීටර් 250ක් පමණ පෙර මෙය පිහිටා ඇත. එතැන සිට කි. මී. 2ක් පමණ යක්කටුව හන්දිය තෙක් ගමන් කොට වමට ඇති මාපලගම පාරට හැරී නැවතත් තවත් කිලෝමීටර් 3ක් පමණ ගමන් කොට ඇත්කඳුර හන්දිය හමුවේ. එතැන් සිට දකුණට ඇති අම්පේගම බද්දේගම පාරට හැරෙන්න. එම පාරේ කිලෝමීටර් 2ක් පමණ ගමන් කොට අවසානයේ දී දකුණට ඇති ගුරු පාරේ මීටර් 150ක් පමණ ගමන් කළ විට අදාළ දේපළ පිහිටා ඇත.

*ගෙවීම් කළ යුතු ආකාරය.* - විකිණීම ස්ථිර කළ විගස පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත අත්පිට මුදලින් ගෙවිය යුතු ය.

01. ගැණුම් මිලෙන් සියයට දහයක් 10%,
02. ඉතිරි සියයට අනූව (90%) ගෙවීම් ස්ථිර කළ දින සිට දින 30ක් ඇතුළත නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. හි ප්‍රධාන කාර්යාලයේ තැන්පත් කළ යුතු ය.
03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),
04. පළාත් පාපලන අය බදු සියයට එකයි (1%),
05. ප්‍රචාරක වියදම් සහ අනිකුත් වියදම් 100%,
06. ලිපිකරු හා සෝෂක වේතනය රු. 1,000,
07. නොතාරිස් ගාස්තුව සහ අනෙකුත් වියදම් රු. 2,000.

හිමිකම් ඔප්පු පරීක්ෂාව සඳහා පහත සඳහන් නිළධාරින්ගෙන් විමසන්න. නීති දෙපාර්තමේන්තුව නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී එල් සී අංක 46/58, නවම් මාවත, කොළඹ 02. දුරකථන අංක 011 4218746.

ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස්,
බලයලත් වෙන්දේසිකරුවෝ,
තක්සේරුකරුවෝ සහ උසාවි කොමසාරිස්වරු,
කොළඹ වාණිජ මහාධිකරණ සහ
දිසා අධිකරණය බලයලත් වෙන්දේසිකරුවෝ
රාජ්‍ය සහ වාණිජ බැංකු

අංක 182, 3 වැනි මහ, හල්ස්ඩෝෆ් වීදිය,
කොළඹ 12.
දුරකථන අංක : 077- 3181891.

04-889

---

**නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී එල් සී**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය ප්‍රකාරව වෙන්දේසියේ පිළිබඳ දැන්වීම

**පළමුවන උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ දෙහිවල ගල්කිස්ස මහ නගර සභා සීමාව තුළ සිරි සරණංකර කොට්ඨාසය අංක 6 තුළ කළුබෝවිල හත්බෝධිය පාරේ පිහිටි වර්තමානයේ වරිපනම් අංක 17/4 දරන නිකුරන්සූරියවත්ත නමැති ඉඩමට (බලයලත් මිනින්දෝරු ඒ. අබේරත්න විසින් මැන සාදන ලද අංක 310 සහ 1972 ජූලි මස 16 සහ 23 දිනැති පිඹුර ප්‍රකාර ලොට් අංක 2 සහ 3 ඒකාබද්ධ කොට නැවත මැනීමක අනුබෙදීමක් වන) බලයලත් මිනින්දෝරු ඩබ්. ටී. සිල්වා විසින් මැන සාදන ලද අංක 665 සහ 1991 අප්‍රේල් මස 01 වැනි දින දින පිඹුර ප්‍රකා ලොට් ඒ නමැති බෙදාවෙන් කරන ලද බිම් කොටස,

ප්‍රමාණය : (අ. 0 රූ 0 පර්. 9.10) පර්චස් නවයයි දශම එකයි බිංදුවක් නොහොත් හෙක්ටයාර බිංදුවයි දශම බිංදුවයි දෙකයි තුනයි බිංදුවක් (හෙක්ටයාර් 0.0230) මෙම දේපළ ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 1855/117 යටතේ ලියාපදිංචි කර ඇත.

තව ද, මෙහි පහත විස්තර කරන ඉඩම් වලින් පයින් ගමන් කිරීමට වාහන වලින් ගමන් කිරීමේ මාර්ග අයිතිය සහ විදුලි කණු සිටුවීම, විදුලි රැහැන් ඇදීම, ජලනල හා ජලපවාහන නල එලීම ආදී ඊට සම්බන්ධ සමාන අයිතිවාසිකම් ඒ අයිතිවාසිකම් භුක්ති විඳින අනෙකුත් තැනැත්තන් සමග පොදුවේ භුක්ති විඳීමේ සම්පූර්ණ නිදහස අයිතිවාසිකම් ස්වාධිනතාව සහ අවසර ය ද සමග

01. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ පල්ලේ පත්තුවේ දෙහිවල ගල්කිස්ස මහ නගර සභා සීමාව තුළ සිරි සරණංකර කොට්ඨාසය අංක 6 තුළ කලුබෝවිල හත්බෝධිය පාරේ පිහිටි වර්තමානයේ වරිපනම් අංක 17/4 දරන නිකුරන්සූරියවත්ත නමැති ඉඩමට (බලයලත් මිනින්දෝරු ඒ. අබේරත්න විසින් මැන සාදන ලද අංක 310 සහ 1972 ජූලි මස 16 සහ 23 දිනැති පිඹුර ප්‍රකාර ලොට් අංක 2 සහ 3 ඒකාබද්ධ කොට නැවත මැනීමක අනුබෙදීමක් වන) බලයලත් මිනින්දෝරු ඩබ්. ටී. සිල්වා විසින් මැන සාදන ලද අංක 665 සහ 1991 අප්‍රේල් මස 01 වැනි දින දරන පිඹුර ප්‍රකාර ලොට් සී නමැති බෙදා වෙන් කරන ලද බිම් කොටස, ප්‍රමාණය (අ 0 රූඩ් 0 පර්. 1.62) පර්චස් එකකුත් දශම හයයි දෙකක් නොහොත් හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි බිංදුවයි හතරයි එකක් (හෙක්ටයාර් 0.0041) විශාල ඉඩම් කැබැල්ල සහ මෙම දේපළ ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 1855/119 යටතේ ලියාපදිංචි කර ඇත.

2. ඉහත කී බටහිර කළුබෝවිල නිකුරන්සූරියවත්ත නමැති ඉඩමට මැන සාදන ලද අංක 1885 දරන පිඹුරේ නිරූපිත ලොට් අංක ඒ 1 නමැති බෙදා වෙන් කරන ලද බිම් කොටස ප්‍රමාණය (අ. 0 රූ. පර්. 32.5) පර්චස් තිස් දෙකයි දශම පහක් විශාල ඉඩම් කැබැල්ල සහ මෙම දේපළ ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 925/202 යටතේ ලියාපදිංචි කර ඇත.

**දෙවන උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ පල්ලේ පත්තුවේ දෙහිවල ගල්කිස්ස මහ නගර සභා සීමාව තුළ සිරි සරණංකර කොට්ඨාස අංක 6 බටහිර කලුබෝවිල හත්බෝධිය පාරේ පිහිටි වරිපනම් අංක 17/4 ඒ සහ 17/4 ඒ 1/1 දරන නිකුරන්සූරියවත්ත නමැති ඉඩමට (බලයලත් මිනින්දෝරු ඒ අබේරත්න විසින් මැන සාදන ලද අංක 310 සහ 1972 ජූලි මස 16 සහ 23 දිනැති පිඹුර ප්‍රකාර ලොට් අංක 2 සහ 3 ඒකාබද්ධ කොට නැවත මැනීමක අනුබෙදීමක් වන) බලයලත් මිනින්දෝරු ඩබ්. ටී. සිල්වා විසින් මැන සාදන ලද අංක 665 සහ 1991 අප්‍රේල් මස 01 වැනි දින දරන පිඹුර ප්‍රකාර ලොට් බී නමැති බෙදා වෙන් කරන ලද බිම් කොටස.

ප්‍රමාණය : (අ. 0 රූ. 0 පර්. 11) පර්චස් එකොළහක් විශාල ඉඩම් කැබැල්ල සහ ඒ තුළ පිහිටි ගහකොළ පළතුරු ගොඩනැගිලි ආදී සෑම සියලු දේ ත් සමග මෙම ඉඩම දෙල්කඳ නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 1855/301 යටතේ ලියාපදිංචි කර ඇත.

තව ද පහත සඳහන් කරන ලද පාර සඳහා වෙන් කළ ඉඩම මතින් ගමන් කිරීමේ මාර්ග අයිතිය ද සමග ය.

01. ඉහත කී බටහිර කළුබෝවිල පිහිටි නිකුරන්සූරියවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. ටී. සිල්වා විසින් මැන සාදන ලද අංක 1885 දරන 1991 අප්‍රේල් මස 01 වැනි දින දරන පිඹුරේ නිරූපිත ලොට් අංක ඒ 1 නමැති බෙදා වෙන් කරන ලද බිම් කොටස, ප්‍රමාණය (අ. 0 රූ. පර්. 32.5) පර්චස් තිස් දෙකයි දශම පහක් විශාල ඉඩම් කැබැල්ල සහ මෙම දේපළ ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 925/202 යටතේ ලියාපදිංචි කර ඇත.

02. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ පල්ලේ පත්තුවේ දෙහිවල ගල්කිස්ස මහ නගර සභා සීමාව තුළ සිරි සරණංකර කොට්ඨාසය අංක 6 කලුබෝවිල හත්බෝධිය පාරේ පිහිටි නිකුරන්සූරියවත්ත නමැති ඉඩමට (බලයලත් මිනින්දෝරු ඒ. අබේරත්න විසින් මැන සාදන ලද අංක 310 සහ 1972 ජූලි මස 16 සහ 23 දිනැති පිඹුර ප්‍රකාර ලොට් අංක 2 සහ 3 ඒකාබද්ධ කොට නැවත මැනීමක අනුබෙදීමක් වන) බලයලත් මිනින්දෝරු ඩබ්. ටී. සිල්වා විසින් මැන සාදන ලද අංක 665 සහ 1991 අප්‍රේල් මස 01 වැනි දින දරන පිඹුර ප්‍රකාර ලොට් සී නමැති බෙදා වෙන් කරන ලද බිම් කොටස, ප්‍රමාණය (අ. 0 රූඩ් 0 පර්. 1.62) පර්චස් එකකුත් දශම හයයි දෙකක් නොහොත් හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි බිංදුවයි හතරයි එකක් (හෙක්ටයාර් 0.0041) විශාල ඉඩම් කැබැල්ල සහ මෙම දේපළ ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 1855/119 යටතේ ලියාපදිංචි කර ඇත.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් නිරෝධා සුපේක්ශලී කලන්සූරිය විසින් සහතික කරන ලද අංක 1107 සහ 2009 මැයි මස 29 වැනි දින දරන උකස් බැදුම්කරය සහ අංක 1108 සහ 2009 මැයි මස 29 වැනි දින දරන උකස් බැදුම්කරය මගින් මෙහි ඉහත උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය අනුජ සෙනරත් බණ්ඩාර රදැල්ල සහ දොන් නිරෝෂිණී කීර්තිචන්ද්‍ර යන අය උකස්කරු වශයෙන් කොළඹ 02, යූනියන් පෙදෙසේ, අංක 242 හි පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී එල් සී නමට උකස් කොට ඇපයට තබා ඇති උකස් බැදුම්කරය මගින් සුරක්ෂිත කරන ලද එකී පහසුකම් මත ලැබිය යුතු ගෙවීම අනුජ සෙනරත් බණ්ඩාර රදැල්ල සහ දොන් නිරෝෂිණී කීර්තිචන්ද්‍ර ණයගැණුම්කැ වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී එල් සී විසින් අප හට පවරා ඇති බලය ප්‍රකාරව, 2015ක් වූ මැයි මස 22 වැනි දින ප. ව. 2.00 ට අදාළ දේපළ පිහිටි ස්ථානයේ දී අප විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.* - කොළඹ සිට ගාල්ල දෙසට ගාලු පාරේ කි. මී. 8ක් පමණ ගමන් කළ විට (දෙහිවල පාලම පසු කර විට) වමට ඇත රෝහල පාරේ (කොටගම සිරි වාචිස්සර මාවතට) හැරී .තවත් මීටර 750ක් පමණ ගමන් කොට වමට ඇති හත්බෝධිය පාරට හැරී තවත් මීටර 460ක් පමණ ගමන් කොට දකුණට ඇති ගුරු පාරේ මීටර් 125ක් පමණ අදාළ දේපළ එම පාරේ අවසානයේ පිහිටා ඇත..

*ගෙවීමේ කළ යුතු ආකාරය.*- විකිණීම ස්ථිර කළ විගස පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත අත්පිට මුදලින් ගෙවිය යුතු ය.

01. ගැණුම් මිලෙන් සියයට දහයක් 10%,
02. ඉතිරි සියයට අනූව (90%) ගෙවීම් ස්ථිර කළ දින සිට දින 30ක් ඇතුළත නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. හි ප්‍රධාන කාර්යාලයේ තැන්පත් කළ යුතු ය.
03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),
04. පළාත් පාලන අය බදු සියයට එකයි (1%),
05. ප්‍රචාරක වියදම් සහ අනිකුත් වියදම් 100%,
06. ලිපිකරු හා සෝෂක වේතනය රු. 1,000,
07. නොතාරිස් ගාස්තුව සහ අනෙකුත් වියදම් රු. 2,000.

හිමිකම් ඔප්පු පරීක්ෂාව සඳහා පහත සඳහන් නිළධාරීන්ගෙන් විමසන්න. නීති කටයුතු දෙපාර්තමේන්තුව, පාරිභෝගික නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී එල් සී අංක 256, ශ්‍රීමත් රාමනාදන් මාවත, කොළඹ 15.

දුරකථන අංක : 077 3918733.

ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස්,
බලයලත් වෙන්දේසිකරුවෝ,
තක්සේරුකරුවෝ සහ උසාවි කොමසාරිස්වරු,
කොළඹ වාණිජ මහාධිකරණ
සහ දිසා අධිකරණය බලයලත්
වෙන්දේසිකරුවෝ රාජ්‍ය සහ වාණිජ බැංකු

අංක 182, 3 වැනි මහළ, හල්ස්ඩ්‍රෝෆ් වීදිය,
කොළඹ 12.
දුරකථන අංක 077- 3181891.

04-888